# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/24 – 2020 ඔක්තෝබර් 06 වැනි අඟහරුවාදා – 2020.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2016/62.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019.08.09 වැනි දින අංක 2135/66 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.07.24 වැනි දින දරන නියෝගයෙන්,

පී. ටී. රංජිත් මයා., නො. 183/A/2, බ්‍රාහ්මණගම, පන්නිපිටිය.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, නො. 170, හයිලෙවල් පාර, නුගේගොඩ.

අතර පවත්නා 2019.07.12 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.07.24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

10 – 814/1

1A – G 33063 – 35 (2020/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2016/62.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

පී. ටී. රංජිත් මයා., නො. 183/A/2, බ්‍රාහ්මණගම, පන්නිපිටිය.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, නො. 170, හයිලෙවල් පාර, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාලබේ, කහන්තොට, මල්වත්ත පාර, නො. 224/14 ඒ, කේ. ඒ. පියරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/62.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. ටී. රංජිත් මයා., නො. 183/A/2, බ්‍රාහ්මණගම, පන්නිපිටිය.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, නො. 170, හයිලෙවල් පාර, නුගේගොඩ.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවක පී. ටී. රංජිත් මහතා විශ්‍රාම පූර්ව නිවාඩු ලබානොගෙන සේවය කරන ලද මාස 03 ක කාලය සඳහා වැටුපට අමතරව ආයතනය විසින් ලබාදෙන මාස 03 ක වැටුප ලබානොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජූලි මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 814/2

මගේ අංකය: IR/COM/05/2016/170.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019.06.03 වැනි දින අංක 2126/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.05.28 වැනි දින දරන නියෝගයෙන්,

පී. ඩී. පී. සිසිල කුමාර මයා., නො. බී-12, නිවාස 500 යෝජනා ක්‍රමය, කිරිවන්දල, පුවක්පිටිය, අවිස්සාවේල්ල.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, නො. 644, ශ්‍රී ජයවර්ධනපුර මාවත, ඇතුල්කෝට්ටේ.

අතර පවත්නා 2019.05.21 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. නවරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.05.28 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

10 – 815/1

මගේ අංකය: IR/COM/05/2016/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

පී. ඩී. පී. සිසිල කුමාර මයා., නො. බී-12, නිවාස 500 යෝජනා ක්‍රමය, කිරිවන්දල, පුවක්පිටිය, අවිස්සාවේල්ල.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, නො. 644, ශ්‍රී ජයවර්ධනපුර මාවත, ඇතුල්කෝට්ටේ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, නො. 453/F, වී. ජයරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2016/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. ඩී. පී. සිසිල කුමාර මයා., නො. බී-12, නිවාස 500 යෝජනා ක්‍රමය, කිරිවන්දල, පුවක්පිටිය, අවිස්සාවේල්ල.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, නො. 644, ශ්‍රී ජයවර්ධනපුර මාවත, ඇතුල්කෝට්ටේ.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරන පී. ඩී. පී. සිසිල කුමාර මයා. ඇතුළු 07 දෙනෙකු 2013.01.31 දින ඉංගිරිය පාරිභෝගික සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයට අයත් 33000 අධිසැර රැහැන් මාර්ග නඩත්තු කටයුත්තකට සහභාගි වී සිටියදී එස්. වී. එස්. රත්නසිරි සේවකයා මියයාම හා හේමාල් ජගත් කුමාර සේවකයා අනතුරට පත්වීම යන සිදුවීම් සම්බන්ධයෙන් පැවති විනය පරීක්ෂණයෙන් පැමිණිලිකරු ඇතුළු ඉහත කී 07 දෙනාට විනය දඬුවම් ලබාදීමෙන් අනතුරුව එම දඬුවමට විරුද්ධව අභියාචනා කිරීමෙන් පසු අනෙකුත් 06 දෙනාගේ දඬුවම් ඉවත්කර සහන ලබාදී, පී. ඩී. පී. සිසිල කුමාර මයාට පමණක් දඬුවම් ලිහිල් නොකිරීම නිසා අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදුවී තිබේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද'' යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 815/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.